## දකුණු පළාත් භාෂා පරිවර්තක සේවයේ භාෂා පරිවර්තක තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 829/7 හා 1994 ජූලි මස 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලදුව, 1992.01.01 දින සිට ක්‍රියාත්මක වන භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාර ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන දකුණු පළාත් භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පළ කරනු ලැබේ.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

............................................

ලේකම්

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සී.සී. රාජකරුණා
ලේකම්
...ළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

20..26.... පෙබ මස ......09........දින

1. ක්‍රියාත්මක වන දිනය
   මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් අනුමත කරන දින සිට ක්‍රියාත්මක වේ.

2. පත් කිරීමේ බලධරයා පිළිබඳ විස්තර

2.1. පත් කිරීමේ බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

3. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1. සේවා ගණය : ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 1

3.2. ශ්‍රේණි : II, I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:
   කාර්යයන්හි ස්වභාවය අනුව තත් කාර්යයන් ඉටු කිරීම සඳහා බඳවා ගැනීමේ අවස්ථාවේ දී අවම මූලික අධ්‍යාපන සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනැමෙන උපාධි සුදුසුකම් සමඟ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ සමාන වෙනත් ප්‍රවීණතා හෝ වෘත්තීය කුසලතා අවශ්‍ය වන්නා වූ ද ආයතනයේ විධායක නිලධරයන්ගේ සහ ආයතන ප්‍රධානීන්ගේ කාර්යයන්ට සෘජුවම උපස්ථම්භක වන්නා වූ ද විධායක නිලධරයන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවරනු ලබන්නා වූ ද කාර්යයන් වේ.

4. තනතුරේ ස්වභාවය : ස්ථිර,විශ්‍රාම වැටුප් සහිතය, එසේවුවද විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්ති තීරණයන්ට නිලධාරීන් යටත්විය යුතු වේ.

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MN 6 – 2025

5.2. වැටුප් පරිමාණය : රු. 62,230 - 10 x 1,190 - 11 x1,360 - 15 x 1,670 – 114,140/-

අනුමත අංකය 332
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
දිනය 2026/03/05 ... කොට ඇති බව
සභාපති ... 18
2026/03/06
... ලේකම්

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

5.3. සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු) |
|---|---|---|
| II | පියවර 01 | 62,230 |
| I | පියවර12 | 75,490 |

6. සේවා ගණයන්ට අයත් තනතුරු: (උපලේඛනය 01)

6.1. අනුමත තනතුරු නාම, තනතුර අනුමත ශ්‍රේණි, අනුමත තනතුරු සංඛ්‍යාව හා එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | I/II | 08 | *අදාළ භාෂා මාධ්‍යයන් අතර පරිවර්තන කටයුතු ඉටු කිරීම.<br>*ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | I/II | 05 | |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 13

7. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1.අධ්‍යාපන සුදුසුකම් :

**භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව හෝ විෂයයක් ලෙස සමත් ව ලබා ගත් උපාධියක් තිබීම.

සහ

I. උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05 ... ... කොට ඇති බව
එච්.ටී.ඩී.එස්.ඩබ්.ශෙර්ත් සහතික කරමි 18
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත
2026/03/06
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

03. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන (පණ්ඩිත) උපාධිය ලබා තිබීම.

සහ

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන 2 - ඉහත 01,02,03 සුදුසුකම්වලින් එකක් සමඟ සිංහල/ දෙමළ භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

7.2.2.2. වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ

7.2.2.3. පළපුරුද්ද: අදාළ නොවේ

7.2.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.2.2.5. වෙනත් :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර (03) ක කාලයක් දකුණු පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව :අවුරුදු 21ට නොඅඩු

7.2.3.2. උපරිම සීමාව :අවුරුදු 35ට නොවැඩි (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අය සඳහා වයස් සීමාව බල නො පැවැත්වේ.)

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය:
විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු බඳවා ගනු ලැබේ.

7.2.4.1. ලිඛිත විභාගය : උපලේඛනය 02

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05 ... කොට ඇත.
සහතික කරමු. 18 ...
2026/03/06
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

II. උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තන ක්‍රම විෂයයක් ලෙස සමත් ව ලබාගත් උපාධියක් තිබීම.

සහ

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හා සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

03. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන (පණ්ඩිත) උපාධිය ලබා තිබීම.

සහ

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන 1 - ඉහත 01,02,03 සුදුසුකම්වලින් එකක් සමඟ සිංහල/ ඉංග්‍රීසි භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ සිංහල භාෂාව හෝ විෂයයක් ලෙස සමත් ව ලබා ගත් උපාධියක් තිබීම.

සහ

I. උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

II. උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තන ක්‍රම විෂයයක් ලෙස සමත්ව ලබාගත් උපාධියක් තිබීම.

සහ

අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05 ඇති බව
සහතික කරමු 18
2026/03/06
ආණ්ඩුකාර ලේකම්



එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

10.1. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම් ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2. උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය (උපලේඛනය 6) පරිදි තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබා දෙනු ලැබේ.

සංලක්ෂය - සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීම ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු වේ.

11. තනතුරුවලට පත් කිරීම - අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : අදාළ නොවේ.

13. විශ්‍රාම ගැන්වීමේ විකල්පය: අදාළ නොවේ.

14. සේවයේ නියුතු නිලධරයින් ප්‍රතිසංවිධිත සේවයේ නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම/ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.

14.1. I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.
මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට දකුණු පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2. II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

[illegible] 332
දකුණු පළාත් ... ආණ්ඩුකාරගුම)
විසින් 2026/03/05 ... ට ඇති බව
සහතික ... 18
2026/03/06



එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

7.2.4.1.1. පවත්වන බලධරයා: දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය: 7.2.2.1 හි සටහන් අනුව පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් වන අතර මේ සඳහා ලකුණු 25 ක් ලබා දෙනු ලැබේ. සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 12 ක් වත් ලබා ගත යුතුය. (උපලේඛන 03)

7.2.4.2.1. පවත්වන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබා දෙනු නොලැබේ.
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

7.2.4.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමකින් හෝ දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීමක් සහ ප්‍රසිද්ධ කරන පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම - අදාළ නොවේ.

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද යන වග | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්) |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 04) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 05) |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද යන වග :
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් මඟින්

9. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත් වූ නිලධාරියෙකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

පිටුව අංකය 332
5 දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05
කොට ඇති බව
සහතික කරමි 18
එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේර
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත
2026/03/06
ආණ්ඩුකාර ලේකම්

යොමු අංකය :CSS/2/6/2/11

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් භාෂා පරිවර්තක සේවය සඳහා වන මෙම සේවා ව්‍යවස්ථාව අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :
නම : ~~සුමිත් අලහකෝන්~~
තනතුර : ප්‍රධාන ලේකම්

දිනය: 2025/11.26

නිල මුද්‍රාව
සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:

නිර්දේශ කරමි.

1. ආර්.එච්.කමල් (සභාපති) ..................
2. එම්.වයි.එස්.දේශප්‍රිය (සාමාජික) ..................
3. තරංගා වික්‍රමරත්න (සාමාජික) ..................
4. ඥාණසිරි වික්‍රමසිංහ (සාමාජික) ..................
5. ටී.ඒ.ධම්මික හේමපාල (සාමාජික) ..................

ආණ්ඩුකාරවර ලේකම්,

2026.01.28 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 157/2026(01)/07 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද දකුණු පළාත් භාෂා පරිවර්තක තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථාව සේවා ව්‍යවස්ථාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2026.02.09

..................
ලේකම්, සී.පී. රාජකරුණා
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

අනුමත කරමි/නොකරමි.

දිනය : ..................

..................
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර
ආචාර්ය [illegible]
ආණ්ඩුකාරවර
දකුණු පළාත.

අනුමත අංකය 332
[illegible]කුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
[illegible]සින් 2026/03/05 [illegible] අනුමත කොට ඇති බව
[illegible] කරමු. නිවු 18 [illegible].

2026/03/06
..................
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එච්.ඩී.පී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට දකුණු පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු භාෂා පරිවර්තක සේවයේ II පන්තියේ නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. අන්තර්කාලීන විධිවිධාන

මේ වන විටත් සේවයේ යෙදී සිටින නිලධරයන්, I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය වන විට II වන කාර්යක්ෂමතා කඩඉම් වැටුප් පියවර ඉක්මවා ඇත්නම් ඔවුන් II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

16. විධිවිධාන සලසා නොමැති කරුණු, මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

17. වෙනත් කරුණු

17.1. මෙම ව්‍යවස්ථා සංග්‍රහය බඳවා ගනු ලබන හෝ අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයින් විෂයයෙහි බලපැවැත්විය යුතුය. පළාත් භාෂා පරිවර්තක සේවාවට අයත් වන තනතුරු හා ඒවා ශ්‍රේණි ගත කිරීම 01 වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට විය යුතුය.

17.2. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි දැක්වෙන අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

17.3. ආයතන සංග්‍රහයේ විධිවිධාන, දකුණු පළාතේ පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහය, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර , දකුණු පළාත් ප්‍රධාන ලේකම් හා රජය විසින් කලින් කලට පනවනු ලබන නීති රීති සහ/හෝ රෙගුලාසිවලට මෙම නිලධරයින් යටත් වනු ඇත.

17.4. මෙම සේවා ව්‍යවස්ථාවෙහි සිංහල, දෙමළ,ඉංග්‍රීසි පිටපත්වල පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

සකස් කළේ :
අත්සන :..........................
නම :කේ.අයි.එම්.පෙරේරා
තනතුර :සංවර්ධන නිලධාරී
දිනය :2025/11/20

පරීක්ෂා කළේ :
අත්සන :..........................
නම : බී.එම්.මධූෂා ජයන්ති
තනතුර :සහකාර ප්‍රධාන ලේකම්(පිරිස්)
දිනය : 2025/11/20
නිල මුද්‍රාව:..........................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන :..........................
නම : කසුන් එස්.කේ.වැල්ලහේවා,
තනතුර : නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
දිනය : 2025.11.21
නිල මුද්‍රාව :..........................

දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2026/03/05 ... ඇති බව සහතික ... 18

2026/03/06

එච්.ඩී.සී.එස්.එස්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

උපලේඛනය 01

**පළාත් භාෂා පරිවර්තක සේවයට ඇතුළත් වන තනතුරු නාම ලේඛනය**

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය | 05 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය | 02 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | ගාල්ල මහා නගර සභාව | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | මාතර මහා නගර සභාව | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | හම්බන්තොට මහා නගර සභාව | 01 |

අනුමත අංකය 332

දකුණු පළාත් ආණ්ඩුකාරතුමා

විසින් 2026/03/05 ... ඇති බව

සහතික ... 18

2026/03/06

එච්.ඩී.ඩී.එස්.ඩබ්.පෙරේරා
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

උපලේඛනය 02

**පළාත් භාෂා පරිවර්තක සේවයේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**
**(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2.4.1. බලන්න)**

1. විභාගයේ නම - භාෂා පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර - සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය1 ½ | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය1 ½ | 100 | 40% |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය1 ½ | 100 | 40% |
| | 4. දෙමළ භාෂාව | පැය1 ½ | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල්
4. විභාගය පවත්වන කාලසීමාව : වසරකට දෙවරක්
5. විභාගය සඳහා විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1.පරිවර්තන සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 2.පරිවර්තනය ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03 ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. සිංහල භාෂාව | රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම,දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම,වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4.ඉංග්‍රීසි භාෂාව | රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම. |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1.පරිවර්තනය සිංහල භාෂාවෙන් | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03 ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |



අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05
18
2026/03/06

ඩබ්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

| | | |
|---|---|---|
| | දෙමළ භාෂාවට | |
| | 2.පරිවර්තනය දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |
| | 3.සිංහල භාෂාව | රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය. |
| | 4.දෙමළ භාෂාව | රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම. |

අනුමත අංකය 332

දකුණු පළාත් ආණ්ඩුකාරතුමා

විසින් 2026/03/05 ... කොට ඇති බව

සහතික කරමි. 18

2026/03/06

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එච්.ඩී.ඩී.එස්.ඩබ්.පෙරේරා
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

උපලේඛනය 03

**පළාත් භාෂා පරිවර්තක සේවයේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය**
(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2.4.2 බලන්න)

1. විභාගයේ නම - භාෂා පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර - සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට හා ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 01 | 25 | 12 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට හා දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 01 | 25 | 12 |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල්
4. විභාගය පවත්වන කාලසීමාව : වසරකට දෙවරක්
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1.පරිවර්තන සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට හා ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේදයක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1.පරිවර්තනය සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට හා දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේදයක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |

සටහන : ඉහත විෂය නිර්දේශය පරිදි දෙන ලද ඡේදය පරිගණක වදන් සැකසීමේ මෘදුකාංගය භාවිතයෙන් පරිවර්තනය කිරීම අර්ථාන්විතව, නිවැරදි වාක්‍ය රටා භාවිතයෙන්, නිවැරදි වග් සම්ප්‍රදායන් අනුකූලව පරිගණක ලේඛනයක අඩංගු පැහැදිලි නිමවකින් යුතුව සකසා තිබීම. (උපරිම ලකුණු 25)

අනුමත අංකය 332
දකුණු පළාත් ගරු ආණ්ඩුකාර්තුමා
විසින් 2026/03/05 ... කොට ඇති බව
සහතික කරමු. 18

2026/03/06

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එච්.ඩී.ඩී.එස්.ඩබ්.පේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

උපලේඛනය 04

## භාෂා පරිවර්තක තනතුර සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි) | 1.පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට සහ ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. කාර්යාල ක්‍රම,ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| | 3. දකුණු පළාතේ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) | 1. පරිවර්තනය සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට සහ දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| | 3. දකුණු පළාතේ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහය | පැය 02 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් මඟින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වර්ෂයකට දෙවරක්

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) (සිංහල/දෙමළ) | කාර්යාල ක්‍රම,ආයතන සංග්‍රහය | (අ) කාර්යාල ක්‍රම<br>• කාර්යාල ක්‍රමවල වැදගත්කම<br>• කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම<br>• ලැබෙන ලිපි හා පිටතට යැවෙන ලිපි පිළිබඳ ගතයුතු ක්‍රියාමාර්ග<br>• ලිපිගොනුවල සටහන් ලිවීම<br>• මහජනයා සමඟ කටයුතු කිරීම පිළිබඳ අවබෝධය |
| | | (ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහය<br><br>(ඇ) ආයතන සංග්‍රහය<br>• VII වන පරිච්ඡේදය<br>• VIII වන පරිච්ඡේදය<br>• IX වන පරිච්ඡේදය<br>• XII වන පරිච්ඡේදය |

අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2026/03/05 දින අනුමත කොට ඇති බව සහතික කරමි.
2026/03/06
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

| | | |
|---|---|---|
| | | • XIII වන පරිච්ඡේදය<br>• XIV වන පරිච්ඡේදය<br>• XXIV වන පරිච්ඡේදය<br>• XXV වන පරිච්ඡේදය<br>• XLVII වන පරිච්ඡේදය |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) (සිංහල/දෙමළ) | දකුණු පළාතේ පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහය | (අ) දකුණු පළාතේ පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහය<br>• I වන පරිච්ඡේදය<br>• II වන පරිච්ඡේදය<br>• III වන පරිච්ඡේදය<br>• IV වන පරිච්ඡේදය<br>• V වන පරිච්ඡේදය |
| භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි) | පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට සහ ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය,නෛතික,විද්‍යාත්මක,තාක්ෂණික,සෞන්දර්යය,සාහිත්‍යය හා ආගමික ලේඛන වලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) | පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට සහ දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනමය,නෛතික,විද්‍යාත්මක,තාක්ෂණික,සෞන්දර්යය,සාහිත්‍යය හා ආගමික ලේඛන වලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |

332

2026/03/05

ඇති බව

18

2026/03/06

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

| | | |
|---|---|---|
| | | ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) | 1.පරිපාලනමය,නෛතික,ලේඛන පරිවර්තනය | පරිපාලනමය,නෛතික, ලේඛනවලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 2. විද්‍යාත්මක හා තාක්ෂණික ලේඛන පරිවර්තනය | විද්‍යාත්මක,තාක්ෂණික, ලේඛනවලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. සාහිත්‍යය, සෞන්දර්යය, හා ආගමික ලේඛන පරිවර්තනය | සෞන්දර්යය,සාහිත්‍යය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |

අනුමත අංකය 332

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා

විසින් 2026/03/05 [illegible]

සහතික කරනු [illegible] 18 [illegible]

2026/03/06

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

උපලේඛනය 05

## භාෂා පරිවර්තක තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි) | 1.පරිපාලනමය, නෛතික, ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |
| | 2.විද්‍යාත්මක හා තාක්ෂණික ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |
| | 3. සාහිත්‍යය, සෞන්දර්යය, හා ආගමික ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |
| භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) | 1. පරිපාලනමය, නෛතික, ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |
| | 2. විද්‍යාත්මක හා තාක්ෂණික ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |
| | 3. සාහිත්‍යය, සෞන්දර්යය, හා ආගමික ලේඛන පරිවර්තනය | පැය 03 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් මඟින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වර්ෂයකට දෙවරක්

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි) | 1.පරිපාලනමය,නෛතික,ලේඛන පරිවර්තනය | පරිපාලනමය,නෛතික, ලේඛනවලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |
| | 2. විද්‍යාත්මක හා තාක්ෂණික ලේඛන පරිවර්තනය | විද්‍යාත්මක,තාක්ෂණික, ලේඛනවලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |
| | 3. සාහිත්‍යය ,සෞන්දර්යය, හා ආගමික ලේඛන පරිවර්තනය | සෞන්දර්යය, සාහිත්‍යය හා ආගමික ලේඛන වලින් තෝරා ගත් ඡේද 02 ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම හා ඡේද 02 |

අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2026/03/05 ... කොට ඇති බව
සහතික කරමි. පිටු 18
2026/03/06
සහකාර ලේකම්
දකුණු පළාත



එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

**05.** දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ..............................මහතා/මෙනවිය/මහත්මිය...............................සේවා ගණයේ භාෂා පරිවර්තක ........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට ,සෑහීමකට පත් වෙමි . ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට.................දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :.................................

අත්සන :..............................

දිනය :.................................

නිල මුද්‍රාව :..........................

**06.** අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව නිර්දේශය හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම :.................................

අත්සන :.................................

දිනය :.................................

නිල මුද්‍රාව :.................................

**07.** ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,ඒ අනුව .............................................................................. ............................මහතා/මෙනවිය/මහත්මිය ...................................................................................... සේවා ගණයේ භාෂා පරිවර්තක........................ ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ......................... දින සිට උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට,සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධාරියා ........................දින සිට ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

අනුමත අංකය 332..........

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා..........

විසින් 2026/03/05 දින අනුමත කොට ඇති බව

සහතික කරමු 18 .......... මි.

2026/03/06

..........

ආණ්ඩුකාර ලේකම්

දකුණු පළාත

නම :.................................

අත්සන :.................................

දිනය :.................................

නිල මුද්‍රාව :.................................

(17)

උපලේඛනය 06

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත

### 01.නිලධාරියා පිළිබඳ තොරතුරු :

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :..............................................................................
1.2 ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................
1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය :..............................................................................
1.4 අයත්වන සේවය හා තනතුර :..............................................................................
1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය :..............................................................................

### 02. පත්වීම පිළිබඳ තොරතුරු :

2.1 පත්වීම් දිනය :..............................................................................
2.2 පත්වීම ස්ථිර කල දිනය :..............................................................................
2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :..............................................................................

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :..............................................................................

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

### 03. උසස්වීමට අදාළ තොරතුරු :

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : I
3.2 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? : ඔව්/නැත
3.3 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කල දිනය : ................................................
3.4 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේ ද? : ඔව්/නැත
3.5 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? : ඔව්/නැත
3.6 උසස්වීමට පූර්වාසන්න පස්වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? : ඔව්/නැත
3.7 විනය දඬුවම් ලබා තිබේ ද? : ඔව්/නැත

### 04. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත්, ............................දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ I ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

දිනය..................................

........................................
නිලධාරියාගේ අත්සන

අනුමත අංකය 332
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා 17
විසින් 2026/03/05 ... ඇති බව
සහතික කරමි 18
2026/03/06

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත